*සැ. යු.* — 2013.07.05 දින පළ වූ අංක 1,818 දරන *ගැසට් පත්‍රයේ* I-III සහ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,819 - 2013 ජූලි මස 12 වැනි සිකුරාදා - 2013.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1644 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1644 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) ශ්‍රී සිද්ධාර්ථ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සංස්කෘතිය සහ සාරධර්ම ගොඩනැගීම සඳහා වූ ශ්‍රී ලංකා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## ගොඩකවෙල ප්‍රාදේශීය සභාව විසින් සකස් කර විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාත් සභාව විසින් ස්ථිර කරන ලද බව ගැසට් පත්‍රයේ නිවේදනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර ගොඩකවෙල ප්‍රාදේශීය සභාව විසින් සාදන ලදුව 2007.03.27 දින පැවති එකී ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීමේ දී සම්මත කරනු ලැබූ සහ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (11) වැනි උපවගන්තියෙන් සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.03.06 දිනැති අංක 1592 දරන ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටසේ නිවේදනය කරනු ලැබූ, මහජන පුස්තකාල, විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා බලතල සීමාව තුළ බදු අයකර ගැනීම පිළිබඳ තොරතුරු හෝ වාර වාර්තා ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අයාලේ යන සතුනගෙන් සිදු වන හානි අවම කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 125 වගන්තිය ප්‍රකාර, සබරගමුව පළාතේ පළාත් සභාව විසින් 2011.03.22 දින පවත්වන ලද සබරගමුව පළාතේ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරනු ලැබූ බව නිවේදනය කරනු ලැබේ.

මහින්ද එස්. වීරසූරිය,
ලේකම්,
ප්‍රධාන අමාත්‍යංශය.

සබරගමුව පළාත් සභාවේ දී.

07-324

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම 2013

අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම්පත්‍ර 2013 ජූලි මස 31 වැනි දින ප.ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

සියලු ඉල්ලුම්පත්‍ර, මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, කල්මුණේ යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය.

මහාධිකරණ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරී තැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති වාහනවල අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම අවසාන දින ප.ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

එක් එක් මෝටර් රථ සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100 ක් සමග පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතුය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2013 ජූලි මස 31 වැනි දින පෙ.ව. 11.30 ට අවසන් වනු ඇත.

| *අනු. අංකය* | *වාහනයේ විස්තර* | *වර්ගය* | *විකිණීම සඳහා ලබාදෙන ලද අංක* | *තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01 | වෑන් රථය 01 | TOYOTA HIACE | MCA/01/2013 | 10,000 |
| 02 | වෑන් රථය 01 | TOYOTA KG-LH162V | MCA/02/2013 | 10,000 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2013 ජූලි මස 31 වැනි දින ප.ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට, මහාධිකරණ සම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහළ මිලක් සඳහන් කොට ඉල්ලුම්කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට කල්මුණේ මහාධිකරණ සම්පාදන කමිටුව අනුමැතිය ලබාදෙයි. ඒ අනුව ඉදිරි විකිණීමේ කටයුතු අදාළ අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් සිදුකරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති මෝටර් රථය කාර්යාල දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 2.30 දක්වා වූ කාලය තුළ අදාළ අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ඇතිව නිරීක්ෂණය කළ හැකිය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියිනම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට අධිකරණයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට් පත් ලබාගත් පසු වහාම අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතුය. එමෙන්ම සියලු ගෙවීම් මුදලින් සිදුකළ යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

මහාධිකරණ කොමසාරිස්තුමා,
නැගෙනහිර පළාත් බඳ මහාධිකරණය,
කල්මුණේ.

| *අනු. අංක* | *නඩු අංක* | *වාහනයේ විස්තර* | *වර්ගය* |
|---|---|---|---|
| 01 | AR/1281/08 | වෑන් රථය 01 | TOYATA -HIACE |
| 02 | AR/1478/08 | වෑන් රථය 01 | TOYOTA - KG - LH162V |

07-235